**කටාන ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

කටාන ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දිනැති හා LGD/09/2019 (1)අංක දරන චක්‍රලේඛයේ ආකෘති ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන ලැබීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 10 සහ වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ හෙළිදරව් කළ යුතු අතර, සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.60,214,195 ක් වූ කිසිඳු ප්‍රාග්ධන ලැබීමක් එලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | නව ගිණුම් ක්‍රමය පිළිබදව නිසි පුහුණුවක් ලබා නොමැති බැවින් නිසි පරිදි ගිණුම් සකස් කිරීමට නොහැකිවී ඇති බව දන්වමි. | |
| (ආ) | ප්‍රමිත උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුළත් EG 3.3 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම කළ යුතු වූවද සමාලෝචිත වර්ෂයේදී සභාවේ දේපල පිරියත උපකරණ ක්ෂය කර නොතිබූ අතර ගිණුම්කරණ ප්‍රතිපත්තිවලද වත්කම් ක්ෂය කිරීමේ පදනම දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂය වන විට ක්ෂය කිරීම් කටයුතු යාවත්කාලීනව සිදුකල හැකි බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ප්‍රමිත අංක 3.5 අනුව හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් වර්ග 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වූවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් කාණ්ඩගත කිරීම කාණ්ඩ 10 ක් යටතේ වර්ග කර තිබූ අතර පරිගණක හා උපාංග, ලී බඩු හා උපකරණ ගිණුම තුළ පෙන්වා තිබුණි. | පරිගණක හා උපාංග, ලී බඩු හා උප කරණ ස්ථාවර වත්කම් යටතේ වර්ගීකරණය කිරීම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු ඉදිරියේදී සිදු කිරීමට නියමිත බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වසරේ රු.11,000 කට ගිණුම්ගත කර තිබූ ඉඩමක් සමාලෝචිත වර්ෂයේදී රු.300,000 කට ප්‍රත්‍යාගණනය කර තිබීම, සමුච්චිත අරමුදල මගින් ගලපනු වෙනුවට ඉඩම් ගිණුම හර කර අයහාර ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) 2018 හා 2019 වසරවල ඉඩම් කට්ටිකර විකිණීමේදී සභාවට හිමිව තිබූ අක්කර 03 යි රූඩ් 03 පර්චස් 25.72 ක් වූ පොදු ඉඩම් කොටස් 12 ක වටිනාකම සභාවේ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඇ) ඉකුත් වසරේ දෙසැම්බර් මස දැන්වීම් පල කිරීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.74,817 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | ණයහිමි වෙන්කිරීමට අතපසුවී ඇති බැවින් 2021වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවීම් කටයුතු සිදුකර ඇති බව දන්වමි. | |
| (ඈ) සභාවට ලැබී ඇති පොදු ඉඩම් කොටස්වල වටිනාකම වූ රු.3,039,000 ක් ජර්නල් සටහන් මගින් පුනරාවර්තන ලැබීමක් ලෙස පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 4 යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් පුනරාවර්තන ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වශයෙන් ලද රු.57,165,195 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන අංක 10 යටතේ හෙළිදරව් කළ යුතු වුවත් එසේ හෙළිදරව් නොකර සටහන් අංක 5 මගින් ආදායමට හඳුනාගැනීමක් සිදු කර තිබූ අතර සියළුම ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයේ ආදායමට හඳුනා ගැනීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එසේම එම වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ශුද්ධ වත්කම් යටතේද දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් සකස් කිරීමේ කටයුතු සිදු කරන බව දන්වමි. | |
| (ඊ) සටහන් අංක 09 යටතේ දැක්විය යුතු මූල්‍ය පිරිවැය රු.2,149,394 ක් සටහන අංක 8 යටතේ දක්වා සටහන් අංක 09 සඳහා හිස් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිකුත් කළ නමුත් වැය ශීර්ෂයට මාරුකර නොමැති හා මිලදී ගත් වටිනාකමට අඩුවෙන් වැය ශීර්ෂයට මාරුකර ඇති ගබඩා ද්‍රව්‍යවල වටිනාකම වූ රු.456,380 ක් ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමේදී වැය ශීර්ෂ හර කරනු වෙනුවට සමුච්චිත අරමුදලට හර කර පොදු ගබඩා ගිණුම බැර කර තිබූ අතර ඒ අනුව එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වැරදීමකින් සමුච්චිත අරමුදලට හර කර ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | වාහන අංගනයක් සකස් කිරීමේ වියදම වූ රු.550,000 ක් ප්‍රාග්ධනීත නොකර අලුත්වැඩියා හා නඩත්තු වියදම් යටතේ ගිණුම්ගත කිරීමෙන් අතිරික්තය හා ගොඩනැගිලි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් සකස් කිරීමේ කටයුතු සිදු කරන බව දක්වමි. | |
| (එ) | තාර දැමීම සඳහා වැය කර තිබූ රු.107,090 ක් හා මාර්ග ප්‍රිමික්ස් දැමීම සඳහා වූ රු.1,000,000 ක් ප්‍රාග්ධනීත නොකර අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඒ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 22 දිනැති හා LGD/10A/4/න.ගි./2019 අංක දරන චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සංචිත හා වෙන්කිරීම් යටතේ දැක්විය යුතු ශේෂ නොගැලපීම් රු.1,231,339 ක් සටහන් අංක 14 තොග යටතේ දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඔ) | දේපළ, පිරියත හා උපකරණ යටතේ මාර්ග, පාලම් හා බෝක්කු වටිනාකම රු.38,617,434 ක් ගිණුම්ගත කර තිබූ අතර එයින් සමාලෝචිත වර්ෂය අවසානයට ගිවිසුම්ගතවීම පමණක් සිදුවී තිබූ රු.18,080,000 ක් වූ ව්‍යාපෘති 30 කට අදාල වටිනාකම, කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබීමෙන් එම වටිනාකමින් එම ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | නව ගිණුම් ක්‍රමය පිළිබදව නිසි පුහුණුවක් ලබා නොමැති බැවින් නිසි පරිදි ගිණුම් සකස් කිරීමට නොහැකිවී ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඕ) | ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයේ 2020 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදල් ශේෂයට ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වැරදි ගැලපීමෙන් හා වසරේ විස්තීර්ණ ආදායම එකතුකළ විට ලැබෙන ශේෂයට සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම ගැලපූ පසු සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදලේ ශේෂය දැක්විය යුතු වුවද සමුච්චිත අරමුදලේ රු.1,101,440,267 ක ශේෂය ඉදිරිපත් කර ඇති ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුලින් ගැලපීම කර ඉදිරිපත් කර නොතිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ක) | විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වූ කිසිදු ප්‍රතිපාදනයක් අවිච්ඡේද නොවන බව කටාන ප්‍රාදේශීය ලේකම් විසින් 2021 ජූලි 13 දින හා 2022 මාර්තු 22 දිනැති ලිපි මඟින් දන්වා තිබියදී රද්දොළුගම පොදු ක්‍රීඩා පිටියේ කායවර්ධන උපකරණ සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ රු.150,000 ක මුදල ණයහිමි හා ණයගැති ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි. | වසර අවසානයේදී ණය හිමි ලේඛනයට ඇතුළත් කරන ලද්දේ ප්‍රාදේශීය ලේකම් මගින් ප්‍රතිපූර්ණය වුවහොත් ගෙවීමට අරමුණු ඇතිව බව දන්වා සිටිමි. | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 12 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.24,649,821 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.4 ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 සිට 2020 වර්ෂ දක්වා වූ කාලයට අයත් විවිධ තැන්පත් තුළ ඇති වරිපනම් අධිගාස්තු, රු.321,301 ක ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වසර 05 කට පෙර සිට පැවත එන රු.119,957 ක් වූ කර්මාන්ත පෙර ගෙවුම් මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර ගණනාවකට පෙර සිට පැවත එන ශේෂයක් බව දන්වමි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ |

**1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

---

විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.3,804,846 ක් වූ වත්කම් සත්‍යාපණය කිරීමට නොහැකි විය.

**1.7 අනුකූල නොවීම්**

---

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | පළාත් පාලන කොමසාරිස්ගේ LGD/06/02/04 පොදු හා 2020 ජූනි 09 දිනැති ලිපිය ප්‍රකාර කඩ කාමර වසා තැබීම සම්බන්ධයෙන් සහන සලසා දීමේදී විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත් විය යුතු වුවද ඒ අනුව එවැනි අනුමැතියකින් තොරව සතිපොළ බදුදීම තුළින් ලැබිය යුතුව තිබූ කුලී ආදායමින් සියයට 50 ක් හෙවත් රු.62,854 ක මුදලක් කපා හැර තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 | නිකුත් කොට මාස 06 ඉක්මවූ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ රු.214,960 ක චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| | (ii) මුදල් රෙගුලාසි 570(ඇ) හා 571(3) | තැන්පත් කොට වසර 2 ක ඉක්මවූ රු.9,266,944 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දින LGD/09/2019(I) චක්‍රලේඛය | එල් ජී 21/2 ආකෘතියෙහි දැක්වෙන පරිදි පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි සීමා අනුමත කර ගත යුතුව තිබූ නමුත් මෙම සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මුල්‍ය ප්‍රකාශන සමඟ අත්තිකාරම් බී ගිණුම ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි මහා සභාව වෙත අත්තිකාරම් ගිණුම් සීමා අනුමැතියට ඉදිරිපත් කොට විගණනය වෙත වාර්තා කරන බව දන්වමි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 167,365,734 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.220,682,923 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ රු.35,023,000 ක වරිපනම් හිඟයෙන් සමාලෝචිත වර්ෂයේ අය කිරීම් කර තිබුණේ රු.12,702,542 ක් පමණක් වූයෙන් හිඟ අය කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. | හිඟ වරිපනම් අයකිරීමේ ප්‍රගතිය සාර්ථක මට්ටමකට ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර පනහ ග්‍රාම නිලධාරි වසමේ සම්පත් පෙදෙස පිහිටි පර්චස් 17.5 ක් විශාල පොදු බිම් කොටස 1994 ජුනි 27 දින නීත්‍යානුකූලව සභාව වෙත පවරා දී තිබියදිත් සභා දේපළ බාහිර පාර්ශවයන් විසින් වසර ගණනාවක පටන් භුක්ති විඳිනු ලබන අතර සභාව සතු දේපල ආරක්ෂාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහෙස්ත්‍රාත් අධිකරණයේ මේ සඳහා නඩුවක් ගොනුකර දැනට විභාග වෙමින් පවතින බව දන්වමි. | සභාවේ දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පරගහවත්ත එස්ටේට් නමැති වෙන්දේසි ඉඩමින් පර්චස් 45 ක පොදු බිම් කොටස 1995 වර්ෂයේදී සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් යාබද ඉඩම් හිමිකරුවෙකු විසින් ඔහුගේ ඉඩමට යාම සඳහා මාර්ගයක් ලෙස මෙම ඉඩම භාවිතයට ගෙන කොන්ක්‍රීට් පාදමක් දමා ඔහුගේ ඉඩමට ප්‍රවේශයක් ලබාගෙන තිබුණි. | එම සැලැස්මේ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | සභාවේ දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | රද්දොළුගම නිවාස සංකීර්ණය තුළ පිහිටි සිගිති උයන, පෙර පාසැල හා ළමා සුරකුම් මධ්‍යස්ථානය ඉදිකර තිබුණු බිම් කොටස් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2008 වර්ෂයේ ඔප්පු මගින් සභාවට පවරා ඇති බවත් එම දේපල සුභ සාධක සංගමයක් විසින් වෙනත් පාර්ශවයකට බදුදී ආදායම් උපයන බවත් නිරීක්ෂණය විය. | සභාවේ පාලනය යටතේ ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා ආකාරය පිළිබඳව කමිටුවක් පත් කර ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වමි. | සභාවේ දේපළ අනවසර භාවිතය සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | වර්ෂ 2001- 2015 කාලය තුළ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමේ ප්‍රමාදය මත අරමුදලින් ගෙවා තිබුණු රු.275,874 ක අධිභාර මුදල අයකර ගැනීම සඳහා දිසා අධිකරණයේ නඩු පවරා වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට හැකියාව පවතින බවට ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්ගේ 2021 අප්‍රේල් 19 දිනැති හා අංක LGD/GM/1/7/පොදු/D-14/2021 දරන ලිපිය මගින් දැනුම් දී තිබුණද 2022 ජනවාරි 22 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මේ වන විට අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. |

**3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

**------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------- | ------------ |
| හෙරිටේජ් ග්‍රෝව් ව්‍යාපෘතියේ ඉඩම් කට්ටි කර විකිණීම මත වූ සියයට 1 ක බදු මුදල වශයෙන් 2016 ජූලි 21 දින රු.2,376,460 ක් වෙන්දේසිකරුගෙන් ලබාගෙන තිබුණි. අදාළ ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් සියයට 1 ක බදු මුදල නිදහස් කර දෙන මෙන් වෙන්දේසිකරු 2021 මැයි 21 දින ඉල්ලා තිබුණද ඊට කලින් සභාව විසින් සියයට 1 ක බදු මුදල ගෙවා නිදහස් කිරීමේ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති සැලසුම් කමිටුව වෙත 2021 අප්‍රේල් 23 දින ඉදිරිපත් කොට එම නිර්දේශ 2021 මැයි 17 දින මහා සභාව වෙත යොමු කිරීමටද කටයුතු කර තිබීම මතභේදයට තුඩු දෙන කරුණක් | පළාත් පාලන කොමසාරිස්ගෙන් නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා නිර්දේශකර ඉදිරිපත් කර ඇති අතර එම සියයට 1 ක විකුණුම් මත බදු මුදල වූ රු.2,376,460 ක චෙක්පත අදාල සමාගම විසින් භාරගෙන වවුචරය | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ අනුව හා ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |

| | |
|---|---|
| විය. එසේම මෙම සියයට 1 ක විකුණුම් මත බදු මුදල 2021 ජූලි 07 දින සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සභාපතිවරයා විසින් ඔහුගේ රුපියල් ලක්ෂ 15 ක මූල්‍ය සීමාව ඉක්මවූ රුපියල් ලක්ෂ 23 ක හදිසි ගෙවීමක් ලෙස වෙන්දේසිකරුට ආපසු ගෙවා තිබුණි. තවද වෙන්දේසිකරු විසින් සභාවට පවරා දී තිබුණු පොදු ඉඩම පැවරුම් ඔප්පුවක් මගින් 2021 ජූලි 07 දින ආපසු වෙන්දේසිකාර සමාගම වෙත පවරා දී තිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(x) වගන්තිය පටහැනිව මෙම බැහැර කිරීම කර තිබුණි. | අත්සන් කර එවා ඇති අතර ලදුපත ලබා ගැනීම සඳහා 2022ජූලි 11 දින ලිපියක් යොමුකර ඇති අතර ලදු පත ලැබුණු පසු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**ප්‍රයෝජනයට නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරුව ප්‍රයෝජනයට ගන්නා අයගේ බඩු බාහිරාදිය තබා ගැනීම සඳහා 2014 වර්ෂයේ පමණ ඉදිකර තිබූ අඩි 24 අඟල් 9 ක් දිග හා අඩි 21 ක් පළල වූ ගොඩනැගිල්ලක් කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා තිබූ අතර එහි වියදම පිළිබඳව සභාවේ වාර්තාවන් නොතිබුණි. | ඉදිරියේදී මුදල් වෙන් කරගෙන සම්පූර්ණයෙන් නිම කර ශ්‍රවනාගාර ගොඩනැගිල්ලේ පහසුකම් සඳහා භාවිතා කිරීමට කටයුතු යොදා ඇති බව තවදුරටත් දන්වා සිටිමි. | නිසි පරිදි සැලසුම් කර ඉදිකිරීම් කළ යුතුවේ. |

**3.4 ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ බාහිර ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු සභාව මගින් අනුමත කර නොතිබියදී, එම ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති 66 ක් ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීම කර තිබුණි.පසුව සභාපතිවරයාගේ නිර්දේශය මත රු.48,174,770 ක් වූ ව්‍යාපෘති වියදම සඳහා අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා ණයහිමි වෙන්කර තිබූ අතර 2022 මාර්තු 30 දින වන විටත් මේ සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි. | සභාව විසින් අදාල වර්ෂය තුළ ගිවිසුම් ගතවී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවීම් කටයුතු කිරීමට එවකට සිටි සභාපතිවරයාගෙන් නිර්දේශයක් ලබාගෙන ඇති බව දන්වමි. | ගිවිසුම්ගතවීමට පෙර ඒ සඳහා අය වැය ප්‍රතිපාදන සකසා ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------- | ------------ |
| ලීටර් 10,000 ගලි බවුසරයක් මිලදී ගැනීම සඳහා ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව ඇණවුම ලබාදී තිබුණේ පෞද්ගලික සමාගමක රු.12,956,400 ක මුදලකට වන අතර එම වර්ගයේම එම රටවල්වලම නිශ්පාදනයක් සඳහා වෙනත් සමාගමක් වෙතින්(නියොජිත සමාගම) රු.11,800,000 කට ඉදිරිපත් කර තිබූ ලංසුව ප්‍රතික්ෂේපවී තිබුණි. තොරා ගත් සමාගම ගලි බවුසරය සඳහා ලොරි රථය සපයනු ලබන්නේ ප්‍රතික්ෂේප කර ඇති නියෝජිත සමාගම මඟින් ඇණවුම් කිරීමෙන් පසුව වන හෙයින් මෙම මිලදී ගැනීම මෙතෙක් සිදුකර ගැනීමට සහාවට නොහැකිවී තිබුණි. ලංසු ලියවිලිවල සඳහන් කොන්දේසි අංක 6 ප්‍රකාරව ලබා ගත යුතු කාර්යසාධන බැදුම්කරය ලබාගෙන නොතිබූ අතර කාර්ය ඉටු නොකළ බැවින් ලබා ගෙන තිබූ රු.90,000 ක ලංසු ඇපකරය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙතෙක් මිලදී ගැනීමට නොහැකිවී ඇත්තේ රජය විසින් පනවන ලද වාරණ නියෝගයක් නිසාවෙන් වන බවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය කර ඇති සුදුසුකම්ලත් ආයතනයෙන් මිලදී ගැනීමට තීරණය කර ඇති බවද දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**සේවක ණය**

-------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------- | ------------ |
| 2021 දෙසැම්බර් 31 දිනට ස්ථානමාරුවී ගිය නිලධාරියෙකුගෙන් රු.212,500 ක් ද, විශ්‍රාමගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් රු.542,252 ක් ද හා සේවය අතහැර ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් රු.680,410 ක් ද වශයෙන් එකතුව රු.1,435,162 ක් වූ ලැබිය යුතු ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට සේවක ණය ලේඛනය සම්පාදනය කර ඇති බව දන්වමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |